පාතහේවාහැට ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

-------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන.**

----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 09 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය.**

------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

-------------------------------------------

**1.3.1 ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම.**

------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් ප්‍රකාශ හඳුන්වා දෙන ලද ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

## 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සදහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.8,961,107ක හිඟහිටි ජල ගාස්තු ශේෂය තුළ සාවද්‍ය ලෙස බිල් කරන ලද රු.1,123,123ක අය නොවන ශේෂයක් පවතින බැවින්, එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව, සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ ඉදිකරන ලද රු.3,031,378ක අගයකට වූ ගොඩනැගිලි ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.97,000ක් වටිනා අත්ට්‍රැක්ටරයක් හා රු.72,850ක් වටිනා කසළ කරත්ත 11ක් අදාළ ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කිරීම නිසා එම ප්‍රමාණයෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සභාව විසින් තැන්පතු වශයෙන් භාර ගෙන පවත්වා ගෙන යනු ලබන නාගරික සංවර්ධන අධිකාරී ගිණුමේ තිබූ රු.389,684ක මුදල් ශේෂය මූල්‍ය ප්‍රකාශන තුළින් අත්හැරී තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂවලට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.55,400ක මුද්දර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ශේෂයන්, අදාළ ගිණුම සමඟ පරීක්ෂා කිරීමේදී, වර්ෂය ආරම්භයේ මුදල් ශේෂය අවසානයේ මුදල් ශේෂය හා මෙහෙයුම් අතිරික්තයේ එකතුව අතර රු.5,878,438 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) සමාලෝචිත වර්ෂයේදී ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ පෙන්නුම් කළයුතු ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජන හා මෝටර් වාහන විකිණීමෙන් ලද රු.10,380,000 ක මුදලක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පෙන්නුම්කර නොතිබුණි.

(ඌ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු රු.86,415 ක මුදල ගෙවිය යුතු තැන්පත් වටිනාකම තුළ දෙවරක් ගිණුම්ගත වී තිබුණි.

(එ) 2003 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලයට අදාළව රජයේ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් ප්‍රතිපූර්ණය විය යුතු බවට දක්වා ඇති රු.3,112,404ක කර්මාන්ත ණයගැතියෝ සාලෝචිත වර්ෂය තුළ දීද, ප්‍රතිපූර්ණය නොවී පැවතුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්.

----------------------------

(අ) ගිණුම් විෂයයන් 04කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.19,615,001ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව, එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.19,789,224ක් වූයෙන් රු.174,223ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) කර්මාන්ත ණයගැති ශේෂ උපලේඛනයේ එකතුව රු.15,378,174ක් වුවත්, එය රු.15,392,974ක් ලෙස ගිණුමේ දක්වා තිබීම නිසා එම උපලේඛනයේ එකතුව රු.14,800ක් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.4 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

**2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.34,983,576ක් වූ අතර එයින් අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.16,479,399ක් වී තිබුණි.**

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

**2013 දෙසැම්බර් 31 දිනට අවු.01ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.6,311,532ක් වී තිබුණි.**

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.3,954,058 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.**

**1.3.6 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.**

**පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.**

| **නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 134 වන වගන්තිය** | **2006 වර්ෂයට පසු සංවර්ධනය කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු පැනවීමට කටයුතු කර නොතිබුණි.** |
| **(ආ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය** | |
| **(i) 180 වන රීතිය** | **සභා බලප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.** |
| **(ii) 177 වන රීතිය** | **රු.1,359,850ක් වටිනා උපකරණ මිලදීගැනීම් සම්බන්ධයෙන් රීති මගින් නියම කර ඇති ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොතිබුණි.** |
| **(iii) 212 වන රීතිය** | **රු.2,213,600ක් වටිනා ජල හා වීථි ලාම්පු උපකරණ, තොග ලේඛණයකට ඇතුළත්වී නොතිබුණි.** |
| **(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 880(1)** | **මුදල් හෝ ගබඩා කටයුතු භාරව ක්‍රියාකරන නිලධාරින් 17 දෙනෙකු ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.** |

| | | |
|---|---|---|
| **(ඇ).** | පළාත් පාලන කොමසාරිස්ගේ **1980** දෙසැම්බර් **31** දිනැති අංක **1980/46** දරන චක්‍රලේඛය | සභාව සතු සංවෘත කඩකාමර **13**ක් හා විවෘත කඩකාමර **07**ක බදු කුලී **2004** තක්සේරුවෙන් පසු නැවත සංශෝධනය නොකර පැරණි තක්සේරුව මතම **2008** වර්ෂයේ ද නව බදු ගිවිසුමකට එළැඹී තිබුණි. |
| **(ඉ).** | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය **XXIV** වෙනි පරිච්ඡේදයේ **4.4** හා **4.5** වගන්ති | නිලධාරීන් දෙදෙනෙකුගේ හා සේවකයින් තිදෙනෙකුගේ දීර්ඝ කාලයක සිට පැවතෙන රු.**36,410** ක ණය ශේෂයන් අයනොවීමේ කාලපරාසය අවුරුදු **02** සිට **07** දක්වා වුවත් අදාළ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**2.** මූල්‍ය සමාලෝචනය

-----------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2013** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**29,874,187**ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**18,276,200**ක් වූයෙන් අතිරික්තයේ රු.**11,597,987**ක වැඩිවීමක් දක්නට ලැබුණි.

**2.2 ආදායම් පරිපාලනය**

**-----------------------**

**2.2.1 වරිපනම් බදු**

**-------------**

**වරිපනම් බදු අයකිරීමට විධිමත් ක්රියාමාර්ගයක් අනුගමනය නොකිරීමේ හේතුවෙන් 2013 ජනවාරි 01 දිනට පැවති රු.5,544,819 ක ශේෂය රු.6,154,106 දක්වා වැඩිවී තිබුණ අතර, එම ශේෂයෙන් 2014 සැප්තැම්බර් 30 දින වන විට තවදුරටත් රු.3,325,723 ක් අය වියයුතුව පැවතුණි.**

**2.2.2 බදු කුලී**

**---------**

**සභාව සතු කඩකාමර බදුදීමෙන් 2013 දෙසැම්බර් 31 දිනට අය වියයුතු රු.2,045,702ක් බදු කුලී අයකර ගැනීමට විධිමත් ක්‍රියාමර්ගයක් සමාලෝචිත වර්ෂය තුළ ගෙන නොතිබුණි.**

**2.2.3 ජල ගාස්තු**

**-----------**

**(අ) ජල පාරිභෝගික සංඛ්‍යාව 3400ක් වුවත්, ජල මනු 2611 ක් පමණක් සවි කර තිබුණි.**

**(ආ) නිසි පරිදි ජල ගාස්තු අය නොකිරීම හේතුවෙන් 2013 ජනවාරි 01 වන දිනට පැවති රු.228,146ක ශේෂය දෙසැම්බර් 31 දින වන විට රු.8,960,107 දක්වා සියයට 30 කින් වැඩිවී තිබුණි. මෙම ශේෂයෙන් 2014 සැප්තැම්බර් 30 දිනට රු.7,520,288 ක ශේෂයක් තවදුරටත් අය වියයුතුව පැවතුණි.**

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් **2013** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ගාස්තු හා මුද්දර ගාස්තුවල වටිනාකම රු.**8,459,824** ක් වී තිබුණි. එම ශේෂයෙන් **2014** සැප්තැම්බර් **30** දිනට රු.**4,542,080** ක් තවදුරටත් අය වියයුතුව ඇත.

**3.** මෙහෙයුම් සමාලෝචනය

----------------------------

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ **2012** හා **2013** වර්ෂයේ අනවසර ඉදිකිරීම් **100**ක් පමණ සිදුකර තිබුණද, ඒ සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ අනුමත කාර්යය මණ්ඩලයේ පැවති සේවක පුරප්පාඩු **39**ක් සම්පූර්ණ නොකර දෛනික පදනම මත සේවකයින් **30** දෙනෙකු සහ දීමනා මත සේවකයින් **12** දෙනෙකු සේවයේ යොදවා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ සභා අරමුදලින් රු.**6,236,828**ක මුදලක් වැටුප් හා දීමනා වෙනුවෙන් වැයකර තිබුණි.

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කොළඹිස්ස ප්‍රදේශයේ ගම්මාන **08**ක පවුල් **900**ක පමණ ජනගහනයක් සඳහා පානීය ජලය ලබාදීමේ අරමුණින් රු.**500,903**ක් වැයකර ක්‍රියාත්මක

කළ කොළඹිස්ස ජල යෝජනා ක්‍රමය මගින් ප්‍රමාණවත් පරිදි ගම්වාසීන් සඳහා ජලය ලබාදීමට නොහැකි වී තිබුණි.

(ආ) ගලහා පුස්තකාල ගොඩනැගිල්ලේ උඩුමහලෙහි කඩකාමර 03ක් ඉදිකිරීම සඳහා කුළුණු ඉදිකර තිබූ අතර, ඉතිරි වැඩ කොටස් ඉටුකර නොතිබියදී එක් කඩකාමරයක් අනවසරයෙන් පුද්ගලයෙකු විසින් අත්පත් කරගෙන තිබුණි. එම පුද්ගලයා ඉවත්කිරීමට කටයුතු කර නොතිබූ අතර යෝජිත ඉතිරි කඩකාමර 02ක වැඩ අවසන් නොකිරීම හේතුවෙන් සභාවට ලැබීමට තිබූ ආදායමක් ද අහිමි වී තිබුණි.

(ඇ) මොරගොල්ල බහුකාර්යය ගොඩනැගිල්ල රු.643,656ක වියදමකින් වැඩ අවසන් කර තිබුණද, එහි පහත මාලයේ කඩකාමර 05 මෙතෙක් කුලියට දීමට හෝ බදුදීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

රු.300,000ක මුදලක් වැයකර කොන්ක්‍රීට් කුළුණු මත කොන්ක්‍රීට් තට්ටුව යොදා ඉදිකරන ලද නුගලියද්ද ප්‍රජා ශාලාව ප්‍රයෝජනයට ගැනීම සඳහා එහි බිත්ති, ජනේල හා දොරවල් සවිකළ යුතුව ඇතත් එම කාර්යයන් 2014 වර්ෂයේදී හෝ නිමකිරීම සඳහා කටයුතු නොකිරීම නිසා දැනට මෙම ගොඩනැගිල්ල නිෂ්කාර්යයව පැවතුණි.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මොරගොල්ල බහුකාර්යය ගොඩනැගිල්ල රු.643,656ක මුදලක් වැයකර ඉදිකිරීම් කටයුතු නිම කර තිබුණු නමුත්, පරීක්ෂාවට ලක් කළ ගොඩනැගිල්ලේ උඩුමහලයට වැසිකිළි පහසුකම් සපයා නොතිබුණි.

(ආ) **2012** සහ **2013** වර්ෂයන් හී සභාවේ කර්මාන්ත **10** ක් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේ දි, රු.**137,729** ක මුදලක් වැඩි පුර ගෙවා තිබු බව අනාවරණය විය.

(ඇ) එස්කැවේටර් යන්ත්‍ර මගින් පස් කැපීමට අදාළව සිදු කළ නියැදි පරීක්ෂාවේ දි, නියමිත රේට් මුදලට වඩා වැඩි මිල ගණන් නියම කර, කර්මාන්ත **08** ක් සඳහා රු.**1,136,066** ක මුදලක් වැඩි පුර ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.**400,000**ක වියදමකින් පස්කපා සකසන ලද නීලවල හැවන්මඩිත්ත පාර ආරම්භයේ පවතින දැඩි බෑවුම් සහිත කොටසට බෑවුම අඩුවන ආකාරයට කොන්ක්‍රීට් කිරීමෙන් ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයක පත්කළ හැකි වුවද, එය විගණන දිනවූ **2014** ජූලි **21** දින වනවිටද සකස් කර නොතිබුණි.

**4.** ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

**4.1** අයවැය පාලනය

-------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් **03**ක සියයට **21** සිට සියයට **50** දක්වාද වියදම් විෂයයන් **05**ක සියයට **31** සිට සියයට **150** දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ආදායම් ශීර්ෂ **04**කට අයත් උප විෂයයන් **07**ක් සඳහා අයවැයගත කළ රු.**12,480,491**ක් වූ ආදායම් අයවීමේ ප්‍රතිශතය සියයට **0** ක් විය.

(ඇ) ආදායම් ශීර්ෂ **04**කට අයත් උප විෂයයන් **05**ක් සඳහා අයවැයගත නොකර රු.**580,284**ක්වූ ආදායම් උපයා තිබුණි.

**4.2** නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

---

**2013** දෙසැම්බර් **31** දින වන විට විගණන විමසුම් **07**කට පිළිතුරු සපයා නොතිබුණි.

**4.3** ප්‍රසම්පාදන සැලැස්ම

---

සභාවේ මිලදීගැනීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

**4.4** විගණනය හා කළමනාකරණ කමිටු පැවැත්වීම

---

ආයතනය තුළ විගණනය හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

**4.5** අභ්‍යන්තර විගණනය

---

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන.**

**--------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ)** **අභ්‍යන්තර පාලනය**

**(ආ)** **ආදායම් පරිපාලනය**

**(ඇ)** **ණයගැති ණයහිමි පාලනය.**

**(ඈ)** **වත්කම් කළමනාකරණය**

**(ඉ)** **කොන්ත්‍රාත් පාලනය.**

**(ඊ)** **තොග පාලනය.**